
# *4.2.4- (සුගතපාල ද සිල්වා)*



**උපත:-** අගෝස්තු 4, 1928, මිදිගම, වැලිගම, මාතර, ශ්‍රී ලංකාව

**විපත:-** ඔක්තොම්බර් 28, 2002 (වයස 74)

කොළඹ, ශ්‍රී ලංකාව

**අධ්‍යාපනය:-** ලොරෙන්ස් විද්‍යාලය ගම්පහ හා නාලන්දා විද්‍යාලය කොළඹ

**රැකියාව:-** චිත්‍රපට නළු සහ වේදිකා නළු

**විවාහය:-** ශීලා ද සිල්වා

**වෙනත් නම්:-** සොඳුරු ආඥාදායකයා

**ජීවන තොරතුරු:-** සුගතපාල ද සිල්වා ( 1928 අගෝස්තු 04 – 2002 ඔක්තෝම්බර් 28 ) සුවිශිෂ්ට ශ්‍රී ලාංකීය නාට්‍ය කරුවෙකු හා නවකතාකරුවෙකි. සුගතපාල ද සිල්වා 1928 අගෝස්තු 04 වන දා ශ්‍රී ලංකාවේ නාවලපිටියේදී උපත ලද්දේ කුඩා වෙළෙන්දෙකුගේ පුතෙක් ලෙසටය. ඔහු එහි සිංහල, දෙමළ හා මුස්ලිම් වෙළෙන්දන් අතර හැදී වැඩුණි. ඔහුගේ මෙම මුල් කාලීන ජීවිත අත්දැකීම් සාහිත්‍යය නිර්මාණවලට මනා පිටිවහලක් වී ඇත. පසුකාලීනව මෙතුමා ගුවන් විදුලි මාධ්‍ය සඳහා 'හඬ නළුව හෙවත් ගුවන් විදුලි නාට්‍ය' හා වේදිකා නාට්‍ය සඳහා 'සොඳුරු ආඥාදායකයා හෙවත් නාට්‍ය නිෂ්පාදක' කෘති දෙක තුළින් එතුමා තුළ මෙම මාධ්‍යයන් පිළිබඳව ඇති හසල දැනුම මනාව ප්‍රකට වේ. මේ නිසා " එසේ වේනම් මිනිසුනේ මෙය අසවු "නවකතා ලිවීමට මගපාදන්නට ඇත.

**වෘත්තීය තොරතුරු:-** සුගතපාලද සිල්වා උපගුරු ඉංග්‍රිසි, ගිණුම් ලිපිකරු, පරිවර්තක, උපකර්තෘ, වශයෙන් හා ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ නිෂ්පාදකවරයා ලෙස බොහෝ කාලයක් කටයුතු කළ අතර 1960 දශකයේ අග භාගයේදී සතිපතා වන රේඩියෝ නාට්‍යයවල හා කෙටි නාට්‍යය වැඩසටහන්වල ප්‍රධානියා වීය..

**ඔහුගේ නාට්‍ය නිර්මාණ:-**

ශ්‍රී ලාංකේය නූතන නාට්‍ය කලාවේ ආරම්භය මනමේ නාට්‍යය හා එදිරිවීර සරච්චන්ද්‍රයන් ගේ මැදිහත් වීමෙන් සිදුවූ අතර මනමේ නම් නාට්‍ය ධර්මී නාට්‍යය ඉදිරිපත් වීමෙන් පසු නාට්‍ය ධර්මී නාට්‍ය නිර්මාණයට පෙළඹීමේ ප්‍රවණතාවක් ඇති වූ අතර එය වෙනස් කරමින් ලෝක ධර්මී නාට්‍ය නිෂ්පාදනය ආරම්භ කළ ප්‍රමුඛයා ලෙසත්, ශ්‍රී ලාංකේය නාට්‍ය වංශයේ යථාර්ථවාදී/ලෝකධර්මී නාට්‍ය සම්ප්‍රදාය මෙරට තහවුරු කළ නාට්‍යකරුවා ලෙසත් සුගතපාල ද සිල්වා මහතා පෙන්වා දිය හැකිය.

- **එක වල්ලේ පොල්** 1958 -නාට්‍ය රචනය
- **බෝඩිංකාරයෝ** 1962 -නාට්‍ය රචනය සහ අධ්‍යක්ෂණය
- **තට්ටු ගෙවල්** 1964 -රචනය සහ අධ්‍යක්ෂණය
- **හරිම බඩු හයක්** 1965 -අනුවර්තනය සහ අධ්‍යක්ෂණය (ඉතාලි ජාතික ලුයිජි පිරැන්ඩෙලෝ ගේ රචකයකු සොයා යන චරිත හයක්)
- **හෙලේ නැග්ග ඩෝං පුතා** 1966 -පරිවර්තනය සහ අධ්‍යක්ෂණය (ඇමෙරිකානු ජාතික ටෙන්සි විලියම්ස් ගේ ද කැට් ඔන් අ හොට් ටින්රූෆ්
- **නිල් කට්රොල් මල්** 1967 -රචනය සහ අධ්‍යක්ෂණය
- **හිත හොඳ අම්මණ්ඩි** 1969 -පරිවර්තනය සහ අධ්‍යක්ෂණය (බර්ටෝල්ට් බ්‍රෙෂ්ට්ගේ ගුඩ් වුමන් ඔෆ් සෙට්ස්සුවාන්ස්)
- **දුන්න දුනු ගමුවේ** 1972 -රචනය සහ අධ්‍යක්ෂණය
- **මුතු කුමාරි** 1973 -පරිවර්තනය සහ අධ්‍යක්ෂණය (ඇලෙක්සැන්ඩ්රේ බ්‍රෙෆෝට් ගේ ඉර්මා ලාඩුෂ්)
- **තුරඟ සන්නිය** 1975 -පරිවර්තනය සහ අධ්‍යක්ෂණය (ජූලියස් හේ ගේ "ද හෝස්")
- **නන්දි විශාල** 1977 - රචනය සහ අධ්‍යක්ෂණය
- **දෑවැද්දෝ** 1979 -රචනය සහ අධ්‍යක්ෂණය
- **සත සහ සත** 1980 -රචනය සහ අධ්‍යක්ෂණය
- **ඇසල සඳ අවන්හල** -1981 -අනුවර්තනය සහ අධ්‍යක්ෂණය (වර්න්ස්හයිඩර් ගේ ද ටී හවුස් ඔෆ් ද ඕගස්ට් මූන්)
- **මරාසාද්** 1986 -පරිවර්තනය සහ අධ්‍යක්ෂණය (පීටර් වයිස් ගේ මරාසාද්)
- **සාන්තුවර සෙබළාණෝ** 1991 - රචනය සහ අධ්‍යක්ෂණය

## **මරාසාද්** 1986




මෙම නාට්‍ය පශ්චාත් ප්‍රංශ විප්ලවයෙන් පසු ගොඩනැගුණු මර්දනකාරී ආඥාදායක සංකීර්ණ දේශපාලන ව්‍යාකූලත්වය වස්තු විෂය කරගෙන තිබේ. මෙම නාට්‍ය විප්ලවීය නායකයෙකු

වූ **මරා** හා **සාද්** අතර විප්ලවයේ අර්ථය හා හරය ඉදිරිමග පිළිබඳව ඇති වන දාර්ශනික, බුද්ධිමය, ගැඹුරු සංවාදය මෙහි කේන්ද්‍රීය ක්‍රියාවලියයි.

මේ ආකාරයට සුගතපාලද සිල්වා නම් වූ සොඳුරු ආඥාදායකයා විසින් නිර්මාණය වූ ඉතා විශිෂ්ට කලා නිර්මාණ වන අතර, සිංහල නාට්‍ය කලාවේ විප්ලවීය නවමු යුගයක් උදා කළ මොහු විශිෂ්ට නාට්‍ය කරුවෙකු ලෙස සම්භාවනාවට පාත්‍රවේ.